**සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාවේ ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2023 අප්‍රේල් 01 දින සිට 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ දෙකක කාල පරිච්ඡේදය සඳහා.**

---

සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාවේ (“සමාගම”) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ දෙකක කාල පරිච්ඡේදය සඳහා වූ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2007 අංක 07 දරන සමාගම් පනතේ 150(1) වගන්තියට අනුව, ශේෂ පත්‍රයේ දින සිට මාස හයක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වගකිව යුතු අය විසින් සහතික කරන බවට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතුය.

## 2.1 ආයතනය පිළිබඳ හැඳින්වීම

සංස්ථාව, 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ 1973 ඔක්තෝබර් 10 දින පිහිටුවා ඇති අතර 1982 ජූලි 01 දින “ශ්‍රී ලංකා (සිලෝන්) රබර් මැනියුෆැක්චරින් කම්පණී ලිමිටඩ්” නමින් සමාගම් අඥා පනත යටතේ සංස්ථාවක් ලෙස නීතිගත කර ඇත. ඉන් අනතුරුව 1995 මාර්තු 06 දින “ශ්‍රී ලංකා රබර් මැනියුෆැක්චරින් ඇන්ඩ් එක්ස්පෝට් කෝපරේෂන් ලිමිටඩ්” නමින් 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සංස්ථාගත කර තිබූ අතර 2007 අංක 07 දරණ නව සමාගම් පනත යටතේ 2009 ඔක්තෝබර් 27 වන දින නැවත සංස්ථාගත කර ඇත. සංස්ථාවට අයත් කර්මාන්තශාලා 06න් කර්මාන්තශාලා 04ක් පමණක් බදු දී තිබුණි. සමාගම, 2025 සැප්තැම්බර් 03 දිනැති අංක අමප/25/1570/804/185 අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඇවර කිරීමට නියමිත වී තිබුණි.

## 2.2 වත්කම් හා වගකීම්වල පැවැත්ම

2016 වර්ෂයෙන් පසු සංස්ථාවේ විගණන කටයුතු ජාතික විගණන කාර්යාලය වෙත පැවරී තිබුණද මේ දක්වා කිසිදු මූල්‍ය ප්‍රකාශනයක් ජාතික විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. සමාගමේ අවසන් වරට පෞද්ගලික විගණන ආයතනයක් විසින් විගණනය කරන ලද 2011 මාර්තු 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අයිතමය | මුදල |
|---|---|
| | රු. |
| ජංගම නොවන වත්කම් | 91,269,967 |
| ජංගම වත්කම් | 832,852,873 |
| | ---------------- |
| මුළු වත්කම් | 924,122,840 |
| | ========== |
| ජංගම බැරකම් | 45,828,678 |
| ජංගම නොවන බැරකම් | 929,570,102 |
| | ---------------- |
| මුළු බැරකම් | 975,398,780 |
| ශුද්ධ වත්කම් / අයිතිය | (51,275,940) |
| | ---------------- |
| මුළු හිමිකම් හා බැරකම් | 924,122,840 |
| | ========== |
| මුළු ආදායම | 75,166,023 |
| මුළු වියදම | 77,894,846 |
| | ---------------- |
| ඌනතාවය | (2,728,823) |
| | ========== |

## 2.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2021 නොවැම්බර් 16 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ අංක පීඊඩී 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා ඊට අනුකූලව නිකුත් කළ මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2016 අප්‍රේල් 01 දින සිට 2025 මාර්තු 31 දින දක්වා වූ වර්ෂ 09 කට අදාළ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා මෙම වාර්තාවේ දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද 2007 අංක 07 දරණ නව සමාගම් පනතේ නියමයන් අනුව 2009 වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂික වාර්තා හා ගිණුම් ප්‍රකාශන සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ඉදිරිපත් කරද නොතිබුණි.

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මූල්‍ය කටයුතු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 ජනවාරි 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මාස 06ක කාලයක් තුළ සංස්ථාව ඈවර කිරීම සඳහා නිසි බලධාරියෙකු පත්කර තිබුණි. 2023 ජුනි 01 සිට 2023 ඔක්තෝබර් 31 දක්වා දින දීර්ඝ කිරීම් කර තිබූ නමුත් සංස්ථාව ඈවර කිරීමේ කටයුතු මෙතෙක් අවසන් කර නොතිබුණු අතර නිසි බලධාරියාගේ කාලය දීර්ඝ කිරීම හෝ නව නිසි බලධාරියෙකු පත් කිරීමටද කටයුතු කර නොතිබුණි. | මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය MF/PE/016/CM/2025/203 අංක දරණ 2025.08.24 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය "ක්‍රියාකාරී මට්ටමේ නොමැති රාජ්‍ය ව්‍යවසායයන් වසා දැමීම සඳහා ඈවරකරුවන් පත් කිරීම" සඳහා අංක අමප/25/1570/804/185 හා 2025.09.03 දිනැති තීරණය අනුව ඈවර කිරීම් කටයුතු කිරීමට නියමිතය. කර්මාන්ත අමාත්‍යාංශයේ හිටපු අතිරේක ලේකම් එන්.ජී. පණ්ඩිතරත්න මහතා 2023.11.01 දින වැවිලි අමාත්‍යාංශයේ වැඩ භාරගැනීමේ ලිපිය මඟින් වැඩ භාරගෙන ඇති අතර ඈවරකරුට අදාළ දීමනා කිසිවක් ගෙවා නොමැති අතර ඉල්ලීම් සහිත ලිපියක් හැර ඒ මහතා සම්බන්ධව වෙනත් කිසිදු ලිඛිත තොරතුරක් නොමැති බව නිරීක්ෂණය වේ. | යොමුගත අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අප්‍රමාදව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | භාණ්ඩාගාරය විසින් ලබාදෙන ලද රු.මිලියන 1379.54 ක් වූ ණය මුදල හා පොලිය පියවීමටත් ඇල්පිටිය ෆෝම් රබර් කර්මාන්තශාලාව සුදුසු ආයෝජකයෙකුට බදුදීමටත් එහි යන්ත්‍ර සූත්‍ර අලෙවි කිරීමටත් 2019 වර්ෂයේදී කැබිනට් අනුමැතිය ලැබී තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඉටුකර නොතිබුණි. මෙම කර්මාන්තශාලාවේ ගොඩනැගිල්ල සහ නිලනිවාස 03ක් ගරාවැටී තිබුණු අතර එහි පවත්නා උපකරණ විශාල ප්‍රමාණයක් සොරකම් කර තිබුණු බව නිරීක්ෂණය විය. | මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය MF/PE/016/CM/2025/203 අංක දරණ 2025.08.24 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය "ක්‍රියාකාරී මට්ටමේ නොමැති රාජ්‍ය ව්‍යවසායයන් වසා දැමීම සඳහා ඈවරකරුවන් පත් කිරීම" සඳහා අංක අමප/25/1570/804/185 හා 2025.09.03 දිනැති තීරණය අනුව ඈවර කිරීම් කටයුතු කිරීමට නියමිතය. එම අවස්ථාවේදී ගනු ලබන තීරණය අනුව ඇල්පිටිය ෆෝම් රබර් කර්මාන්ත ශාලාව තුළ පවතින්නා වූ යන්ත්‍ර සූත්‍ර වෙන්දේසි කර එයින් ලැබෙන මුදල් භාණ්ඩාගාරය වෙත ලබාදීමට කටයුතු කිරීමට නියමිතය. | යොමුගත අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අප්‍රමාදව වගකීම් පියවීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් කටයුතු

| | | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | (i) | **මාවනැල්ල කේන්ද්‍රාපසාරී කර්මාන්තශාලා** | | |
| | | මාවනැල්ල කේන්ද්‍ර අපසාරි කර්මාන්ත ශාලාවේ කඩා වැටී ඇති ප්‍රධාන ගොඩනැඟිලි වහලය ප්‍රතිසංස්කරණය කර නොදීම හේතුවෙන් බදු ගැනුම්කරු විසින් 2018 ජූලි සිට බදු කුලී ගෙවා නොතිබුණු අතර 2018 ජුනි දක්වා ගෙවූ බදු කුලිය තුළ එම වර්ෂයේ වැඩි වූ බදු කුලිය ගෙවීම් කර නොතිබුණි. වසර 07කට වැඩි කාලයක් තුල අයවිය යුතු මුළු හිඟ බදු කුලිය රු.44,869,590ක් වූ අතර ප්‍රධාන ගොඩනැඟිලි වහලය ද ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | කර්මාන්තශාලාවේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර නියමිත බදු කුලිය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| | (ii) | **මාවනැල්ල ටයර් ටියුබ් හා බදුරලිය ක්‍රේප් රබර් යන කර්මාන්තශාලා දෙක** | | |
| | | බදු ගිවිසුම් කොන්දේසි අංක 05 අනුව 2021 මාර්තු 14 සිට වැඩි විය යුතු බදු කුලිය අයකරගෙන තිබුණ ද 2017 මාර්තු 13 දින සිට 2021 මාර්තු 13 දක්වා කාලය සඳහා වැඩි වූ බදු කුලිය එනම් රු.3,908,016ක් අයකරගෙන නොතිබුණි. එසේම 2020 අප්‍රේල් සිට 2025 මාර්තු දක්වා මෙම කර්මාන්තශාලා දෙකෙහි අය වූ බදු කුලිය සම්බන්ධ විස්තරද විගණනයට ඉදිරිපත් නොවුණි. | පිළිතුරු ලබා දී නොමැත. | බදු ගිවිසුම් ප්‍රකාරව බදු කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර විගණනයට අවශ්‍ය තොරතුරු නිසි පරිදි ලබා දිය යුතුය. |
| | (iii) | ඉහත කර්මාන්තශාලා 03, රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව මගින් පුද්ගලික සමාගමකට 2014 වර්ෂයේ දී බදු දී තිබූ අතර මේ වන විට එම සංස්ථාව අකර්මන්‍යව පැවතියද බදු ගිවිසුම් යාවත්කාලීන කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. වර්තමානයේදී කර්මාන්තශාලාවල බදු මුදල් එකතු කරනු ලබන්නේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් වේ | පිළිතුරු ලබා දී නොමැත. | බදු ගිවිසුම් ප්‍රකාරව බදුකුලී අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර විගණනයට අවශ්‍ය තොරතුරු නිසි පරිදි ලබා දිය යුතුය. |
| (ආ) | | **වහරක ක්‍රේප් රබර් කර්මාන්තශාලාව** | | |
| | | මෙම කර්මාන්ත ශාලාව 2011 පෙබරවාරි 01 සිට 2026 ජනවාරි 31 දක්වා වසර 15ක් සඳහා පුද්ගලික සමාගමකට බදු පදනම මත ලබා දී තිබුණු නමුත් මෙම සමාගම විසින් 2021 වර්ෂයේදී කර්මාන්තශාලාව අතහැර | පිළිතුරු ලබා දී නොමැත. | බදු ගිවිසුම් ප්‍රකාරව අයවිය යුතු බදු කුලී හා ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර බදු ගිවිසුම්වල මුල් |

| | | | |
|---|---|---|---|
| | දමා ගොස් තිබුණි. එම පුද්ගලික සමාගම වෙතින් තව දුරටත් අයවිය යුතු බදු මුදල් හා ගිවිසුමේ 9 වන වගන්තිය ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර තිබුණේද ආදී විස්තර විගණනයට ඉදිරිපත් නොවීය. තවද 2021 අගෝස්තු 01 සිට 2026 ජනවාරි 31 දක්වා රු.85,000ක මාසික කුලියට යථෝක්ත කර්මාන්ත ශාලාව වෙනත් පෞද්ගලික සමාගමකට නැවත බදු දී තිබුණු නමුත් එම සමාගම සමග එළැඹි බදු ගිවිසුමෙහි මුල් පිටපත විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | | පිටපත් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | **දොඩම්ගොඩ මෝල්ඩඩ් කර්මාන්තශාලාව** | | |
| | බූදල් නඩුවක් මාර්ගයෙන් කර්මාන්තශාලාව පිහිටි ඉඩම අයිතිකරු විසින් නැවත පවරා ගෙන ඇතිබව දක්වා තිබුණද ඒ පිළිබඳ අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූ අතර මෙම කර්මාන්තශාලාවේ තිබුණු වත්කම් සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳවද විගණනයට අනාවරණය කර ගැනීමට නොහැකි විය. | දොඩම්ගොඩ මෝල්ඩඩ් කර්මාන්ත ශාලාව බූදල් නඩුවක් මාර්ගයෙන් අදාළ කර්මාන්ත ශාලාව පිහිටි ඉඩමේ අයිතිකරු විසින් පවරා ගැනීම සම්බන්ධව ලියවිලි හෝ තොරතුරු සොයාගැනීමේ අපහසුතාවයක් පවතින අතර මේ පිළිබඳව නිසිබලධාරී තනතුරෙහි එවකට කටයුතු කළ එස්.ඩබ්ලිව්.ගමගේ මහතා හට වාර්තාවක් ලබාදෙන ලෙස දැනුම්දී ඇත. | මෙම පවරා ගැනීමට අදාළ නඩු තීන්දු පිටපත් හා ලේඛනගත සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |